# මිනිස් වෙළඳාමට හෝ ජාවාරමට හසු නොවී

# හරි පාරෙන් රට යමු



ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# විදේශගත වීමට පෙර
# ඔබ දැනගතයුතු කරුණු

- විදේශගත වීමට පෙර ඔබ විසින් නීත්‍යානුකූලව ලබාගත් ගමන් බලපත්‍රය, ගුවන් ටිකට්පත, අදාළ රටෙහි වීසාව, කොවිඩ් පරීක්ෂණ සහතික සහ එන්නත් සහතික මෙන්ම රැකියා සඳහා ලබා ඇති පුහුණු සහතික ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ.

- ඔබ රැකියාවක් සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන්නේ නම් එම රටට අදාලව රැකියා කිරීම සම්බන්ධයෙන් ඇති නීති රීති පිළිබඳ දැනුවත් වීම. (මේ සඳහා මෙම පත්‍රිකාව අවසානයේ ඇති සහාය ලබාගත හැකි ආයතනවල දුරකථන අංකවලට හෝ තානාපති කාර්යාල හරහා තොරතුරු ලබා ගන්න.)

- ඔබ රැකියා ඒජන්සියක් හරහා විදේශගත වන්නේ නම් එම රැකියා ඒජන්සිය ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වූ බව තහවුරු කරගෙන එහි නීත්‍යානුකූලභාවය සහ අදාල කටයුතු පිළිබඳ තොරතුරු විමසා තහවුරු කරගැනීමට වග බලා ගන්න.

- නීත්‍යානුකූලව විදේශ රැකියාවකට යන සෑම අවස්ථාවකදීම ජීවිත රක්ෂණාවරණයක් සලසා ගෙන තිබීම වැදගත් වන අතර නීති විරෝධීව

රටකට ඇතුළුවූ පුද්ගලයෙකුට නියමිත පරිදි සෞඛ්‍ය පහසුකම්, වැටුප් හෝ අනෙකුත් වරප්‍රසාද නොලැබීම (විදේශ රටවල සෞඛ්‍ය වියදම් ඉතා ඉහළ බැවින් වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට නොහැකිවීමෙන් ඔබගේ ජීවිතය පවා අහිමි විය හැක)

- සංචාරක වීසාවකින් විදේශ රටකට ඇතුළුවූ පුද්ගලයෙකුට එකී සංචාරක වීසාව, රැකියා වීසාවක් බවට පරිවර්තනය කිරීමට අවස්ථාව නොලැබීම. (උදා: මැලේසියාව)

- ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු විදේශ රැකියාවකට යන්නේ නම් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය අනිවාර්ය වීම.

- මුහුදු මාර්ගය ඔස්සේ රටවල් වලට ඇතුළු වුවත් රැකියා කිරීමට වීසා හෝ සරණාගතභාවය නොලැබීම (උදා: ඕස්ට්‍රේලියාවට මුහුදු මගින් ඇතුළු වුවද රැඳවුම් කඳවුරක රඳවා තබා නැවත ශ්‍රී ලංකාවට පිටුවහල් කිරීම.)



## නියමාකාරයෙන් විදේශගත නොවීමෙන් ඔබට සිදුවිය හැකි ප්‍රතිවිපාක

- නීති රීති උල්ලංඝණය වීම නිසා විදේශගත වීමට ගුවන්තොටුපොළට පැමිණිවිට අත්අඩංගුවට පත්වීම (උදා: ආගාමික හා විගාමික පනතේ නීති විරෝධීව රටින් පිටවීම/තැත්කිරීම අපරාධමය වරදකි)

- තමන් උපයාගත් මුදල් ජාවාරම්කරුවෙකුට දීම නිසා තම වත්කම් මිල මුදල් ආදිය අහිමි වීම (මෙවැනි සිද්ධීන් නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පැමිණිලි විශාල සංඛ්‍යාවක් විභාග වීම හා එම මුදල් ලබාගැනීම අපහසු වීම)

- තමන් ගමන් කරන රටෙහි (Destination) අතරමැදි රටෙහි (Transit) අත්අඩංගුවට පත්වීම හෝ විවිධ අපරාධ සංවිධාන වල ගොදුරක් බවට පත්වීම (බොහෝවිට මේ හා සම්බන්ධ වනුයේ ත්‍රස්තවාදී සංවිධාන හෝ මාෆියා සංවිධානවල අපරාධකරුවන්ය)

- මිනිස් ජාවාරම්කරුවන් විසින් පුද්ගලයන් ප්‍රවාහනයට ඉතා අනාරක්ෂිත ක්‍රමවේද භාවිත කරන නිසා ජීවිත හෝ වෙනත් ශාරීරික හානි සිදුවීමට වැඩි ඉඩක් පැවතීම (උදා: කන්ටේනර් රථ, මාළු බෝට්ටු, ට්‍රෝලර් යාත්‍රා)

- නීති විරෝධීව රටකට ඇතුළුවීම හෝ ඒ සඳහා උත්සාහ කිරීමේදී අදාළ රටෙහි ආගමන විගමන නීති උල්ලංඝණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඔබට නැවත එම රටට ඇතුළුවීම තහනම් කිරීම, හරවා එවීම (Refuse Entry) සිරදඬුවම්වලට යටත්ව පිටුවහල් කිරීමට ලක්වීම (මේ හේතුව නිසා ශ්‍රී ලාංකිකයන් විශාල ප්‍රමාණයක් විදේශීය සිර කඳවුරුවල හෝ ආරක්ෂිත නිවාසවල ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව වාසය කරයි)

- නීති විරෝධීව විදේශගත වී අපහසුතාවයට ලක් වුවහොත් ඔබගේ පවුලේ සමීපතමයන් හට තම තැන්පත් ධනය, ගේ දොර ඉඩකඩම් වැය කිරීමට හෝ විකිණීමට සිදුවීමෙන් ඔබ දැනට සිටිනවාටත් වඩා ආර්ථික පරිහානියකට ලක්වීම (මෙවැනි සිදුවීම් සඳහා රාජ්‍ය මැදිහත් වීම අඩු බැවින් තම පෞද්ගලික මුදලින් ගුවන් ටිකට්පත් හෝ දඩ මුදල් ගෙවීමට සිදුවීම)



## මිනිස් වෙළඳාම යනු

**මුදල් හෝ වෙනත් ප්‍රයෝජනයක් අපේක්ෂාවෙන් යම් පුද්ගලයෙකු රවටා බියගන්වා, බලය යොදවා හෝ තර්ජනය කිරීමෙන් එම තැනැත්තා පැහැරගෙන යාම, බඳවා ගැනීම හෝ ප්‍රවාහනය කිරීමෙන් එම තැනැත්තාව රට තුලදී හෝ රටින් පිටතදී සූරාකෑමට ලක් කිරීමයි.**

උදා: විවිධ පුද්ගලයින්, කණ්ඩායම් විසින් ඉතා හොඳ රැකියා අවස්ථා ඇති බවට බොරු පොරොන්දු ලබා දී මෙරට තුළදී හෝ වෙනත් විදේශ රටකදී හෝ ඔබව ලිංගික සේවයේ යෙදවීම, ගිවිසගත් ආකාරයෙන් ගෙවීමක් නොකර බලහත්කාරයෙන් විවිධ වැඩකරවා ගැනීමේ හෝ ඔබගේ වකුගඩු වැනි අවයව වංචනික ආකාරයෙන් ඉවත් කර ගැනීම දැක්විය හැකිය.

## මිනිස් ජාවාරම යනු

**මුදල් හෝ වෙනත් ප්‍රයෝජනයක් අපේක්ෂාවෙන් තමාට ජාතිකත්වයක් හෝ ස්ථිර පදිංචියක් හිමි නොවන රටකට නීති විරෝධීව ඇතුළු වීම සඳහා පුද්ගලයන්ට පහසුකම් ලබා දීමයි**

# මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම අතර ඇති වෙනස්කම්

| මිනිස් වෙළඳාම | මිනිස් ජාවාරම |
| --- | --- |
| තමාගේ මවු රටෙහිම වුවද ප්‍රදේශයකින් ප්‍රදේශයකට රැගෙන ගොස් සූරාකෑමට ලක් කල හැකිය | නීති විරෝධීව රටකින් රටකට ගෙන යාම අනිවාර්යයෙන්ම සිදුවේ |
| මිනිස් වෙළඳාමට ලක්වන පුද්ගලයා ඒ පිළිබඳව නොදැනුවත්ව රැවටීමට ලක්වේ | නීති විරෝධීව රටකින් රටකට ගෙන යාම සිදුවන බව දැනගෙනම ඒ සඳහා රැවටීම හෝ ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වේ |
| වින්දිතයා ගමනාන්තයෙදී දිගින් දිගටම සූරාකෑමට ලක් කිරීම සිදුවේ. | ගමන් කරන රටට ලඟා වීමෙන් අනතුරුව ජාවාරම්කරුගේ සහභාගීත්වය අවසන් වේ |
| ගමනාන්තයෙදී පුද්ගලයාගේ නිදහස් ගමනාගමනය/ සංචරණය පාලනයකට ලක්වේ | ගමන් කරන රටට ලඟා වීමෙන් පසු ජාවාරම්කරුගේ පාලනයෙන් නිදහස් වේ |

# මිනිස් වෙළඳාම හා මිනිස් ජාවාරම අතර ඇති සමානතා අසමානතා

**මිනිස් ජාවාරමට ගොදුරක් වන බොහෝ පුද්ගලයින්ද මානව හිමිකම් උල්ලංඝණයට ගොදුරු විය හැක. ප්‍රායෝගික ලෝකයේ ක්‍රියාත්මක වන අයුරු විමසා බලන කල්හි සංකල්ප දෙකම එක හා සමාන අයුරින් පෙනී යන අවස්ථා ද පවතී.**

උදා: යම් පුද්ගලයෙකු විසින් තමන්ව නීති විරෝධී අයුරින් තවත් රටකට ඇතුල්වීම පිණිස ජාවාරම්කරුවෙකු මගින් උපකාර ඉල්ලා සිටිය හැකි අතර එහිදී ඔහු/ඇය සුරාකෑමට ලක්වන ආකාරයේ රැකියාවකට පත්විය හැක. එනම්, ජාවාරම්කරුට මුල්‍යමය වාසියක් සැලසෙන ආකාරයේ වහල්භාවය වැනි තත්වයකට අදාළ පුද්ගලයා පත්විය හැක.

**නිදසුනක් ලෙස ජාවාරම්කරුට මුල්‍ය ගෙවීමක් කිරීම සඳහා වහල් තත්වයක් යටතේ වැඩ කිරීමට සිදුවීම, වලංගු ගමන් බලපත්‍රයක් හෝ ගමන් ලියවිලි නොමැති වීම, ගමන් කරන රටේ භාෂාව කතා කිරීමට නොහැකි වීම, රැකියා සොයාගැනීමට ඇති අපහසුතාවය යන අනාරක්ෂිත තත්වයන්ට පත්වන මෙම අක්‍රමවත් සංක්‍රමණිකයන්ගේ අසරණභාවය ප්‍රයෝජනයට ගන්නා මිනිස් වෙළඳාම්කරුවන් ඔවුන් මිනිස් වෙළඳාමේ අපරාධයට නතුකර ගනී.**

## 1948 අංක 20 දරණ ආගමික හා විගාමික පනත හා එහි සංශෝධන අනුව පහත සදහන් දෑ අපරාධමය වරදවල් වේ

- නීත්‍යානුකූල නොවන ලෙස පුද්ගලයෙකු පුද්ගලයන් කිහිප දෙනෙකු රට හැර යාමට සංවිධානය කිරීම හෝ සැළසුම් කිරීම
- එසේ සංවිධානය වීමට උත්සාහ කරන, සුදානම් වන හෝ සංවිධානය වීමට වෙනත් අයෙකුට සහාය දීම (සංවිධානය කිරීම යන්නෙන් විදේශ රටකට රැකියා ලබාදීමේ පොරොන්දුව පිට පුද්ගලයන් බඳවා ගැනීම, දැන දැනම ව්‍යාජ පොරොන්දු ලබාදීම, වැරදි කරුණු ඉදිරිපත් කිරීම, නොමග යවනසුළු ප්‍රකාශ කිරීම, මුහුදෙන්, ගොඩබිමින් හෝ ගුවනින් පුද්ගලයන් ප්‍රවාහනය)
- තමන්ට අයිති නොවන ගමන් බලපත්‍රයකින් විදේශගත වීමට තැත්කිරීම.
- අනුමත නොවූ තොටුපලකින් විදේශගත වීම. (උදා: අනුමත ගුවන් තොටුපොළක් හෝ වරායක් නොවන)
- පනත ක්‍රියාත්මක කරන නිලධාරියෙකුට බාධා කිරීම හෝ අසත්‍ය වාර්තා/ප්‍රකාශ සිදු කිරීම
- ගමන් බලපත්‍රයක්, වීසා බලපත්‍රයක් හෝ යම් සහතිකයක් ව්‍යාජ ලෙස සෑදීම හෝ වෙනස් කිරීම.

- ව්‍යාජ ලෙස සාදන, වෙනස් කරන ලද අවිධිමත් ගමන් බලපත්‍රයක් නීත්‍යානුකූල බලය නොමැතිව තමන් සන්තකයේ තබා ගැනීම
- ඉහත වරදක් කිරීමට උත්සාහ කිරීම හෝ සහාය ලබාදීම
- ඉහත වරදවල්වල ස්වභාවය අනුව ඔබ වැරදිකරුවෙකු වුවහොත් එක් අවුරුද්දක සිට අවුරුදු 05 ක් දක්වා බරපතල වැඩ ඇතිව සිරගත කිරීමකට සහ රුපියල් ලක්ෂ 02 කට නොවැඩි දඩයකට යටත් විය හැක.

**1994 අංක 4 හා 2009 අංක 56 දරණ පනත් මඟින් සංශෝධිත 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව පහත සඳහන් වැරදි අපරාධ වැරදි වේ.**

- වලංගු බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා නියෝජිතායතනයක් පවත්වාගෙන යාම
- වලංගු බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ලබා දීම සඳහා මුදල් අය කිරීම
- විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවී විදේශ රැකියාවක් පිණිස විදේශගත වීම.
- විදේශ රැකියාවක් සඳහා විදේශගත වීමේදී ව්‍යාජ ලේඛණ ඉදිරිපත් කිරීම.

## විදේශ රැකියා සඳහා යොමුවන සියලු ශ්‍රී ලාංකිකයන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි විය යුතු අතර එසේ ලියාපදිංචි වීමෙන් ඔබට ලැබෙන වාසි

විදේශ රැකියාවේ යෙදී සිටියදී සිදුවන ජීවිත හානි/ නැවත මෙරටට පැමිණීමට මුදලින් ආධාර සපයන ආකාරයේ රක්ෂණ ආවරණයක් සැළසීම.

රක්ෂණ ආවරණයට අමතරව විදේශ රැකියාවේ යෙදී සිටියදී සිදුවන හදිසි අනතුරු/අසනීප/කරදර හිරිහැර සඳහා සහන සැළසීම

තීරුබදු රහිත විදුලියෙන් ක්‍රියා කරන වාහන ලබාදීම

ආබාධිත විගමණික සේවක පිරිස් සඳහා නිවාස සහ කෘත්‍රිම අවයව සැපයීම

පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම සහ අවශ්‍යතාවය පරිදි ඖෂධ හා අනෙකුත් වෛද්‍ය උපකරණ නොමිලේ ලබාදීම

පෙර විගමණික ණය සඳහා රාජ්‍ය බැංකුවලට නිර්දේශ ලිපි නිකුත් කිරීම

දායකත්ව විශ්‍රාම වැටුපක් ලබාදීම (මනුසවි)

ස්වයං රැකියා ආධාර ලබාදීම

උපදේශන සේවා හා අනෙකුත් සුබ සාධන පහසුකම් ලබාදීම

ආර්ථික අපහසුතා සහිත දරුවන්ට පාසල් උපකරණ ලබාදීම

දූ දරුවන් සඳහා අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම

## ලියාපදිංචි නොවීමෙන් විදේශ ගතවීම නිසා ඇතිවන ප්‍රතිවිපාක

**විදේශයකදී කරදරයකට පත් වූ විට නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට ඇති හැකියාව සීමා සහිත වීම.**

---

**රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වීම.**

---

**අපරාධකරුවන් හෝ වංචාකරුවන්ට නියමාකාරයෙන් උපරිමයෙන් දඬුවම් දීම අසීරු වීම.**

---

**නීතිමය කටයුතුවලට යොමුවන අවස්ථාවන්වලදී විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මැදිහත් වීමට ඇති අපහසුතාවය**

**මෑත කාලයේ වාර්තා වූ සත්‍ය සිදුවීමක්**

කුවේට් රාජ්‍යයේ ඉරාන දේශසීමාව ආසන්නයේ පිහිටි කාන්තාරයක පවත්වාගෙන ගිය ගොවිපොලක බලහත්කාරයෙන් රඳවාගනිමින්, පහර දෙමින්, ආහාර සහ වැටුප් ලබා නොදෙමින් වැඩ ගනිමින් ලාංකික තරුණයන් 06 දෙනෙකු බලවත් පරිශ්‍රමයක් දරා එයින් බේරා ගෙන කටුනායක ගුවන් තොටුපොල වෙත ඒවා තිබුණි. මොවුන් සියලු දෙනා ත්‍රිකුණාමලය කින්නියා ප්‍රදේශයේ පදිංචිකරුවෝ වූහ.

මොවුන් පිරිස කින්නියා ප්‍රදේශයේ නීත්‍යානුකූල නොවන තැරැව්කරුවෙකු මාර්ගයෙන් කුවේටයේ රැකියා සඳහා ගොස් තිබූ අතර එම පිරිස කුවේට් රාජ්‍යයේ ෂේක් වරයෙකු විසින් පවත්වා ගෙන යනු ලබන ගොවිපොලක මෙසේ සේවයේ යොදවා තිබුණි. මෙම ශ්‍රී ලාංකිකයින් පිරිස මෙම ගොවිපොළේ සිට කුවේටයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත රාත්‍රී කාලයේ ලබාදුන් දුරකථන ඇමතුමක් අනුව ඔවුන් බේරා ගැනීමේ මෙහෙයුම සකස් කර ඇත. කටුනායක ගුවන් තොටුපොල වෙත පැමිණි මෙම තරුණයන් පිරිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් විසින් භාරගෙන ඔවුන්ගේ නිවෙස් වෙත යැවීමට පියවර ගෙන තිබේ.

**(2023 ජනවාරි 06 දින දිනපතා පුවත්පතකින් උපුටා ගැනීමකි)**

**මෙම පොත් පිංච හා ඔබ ලබාගත්**
**දැනුම තවත් කෙනෙකු සමඟ**
**බෙදාගැනීමට කාරුණික වන්න**



# ඔබට අවශ්‍ය සහාය සඳහා වන තානාපති කාර්යාල දුරකථන අංක

| | |
|---|---|
| තානාපති කාර්යාලය - ඩුබායි | 0097143986535 |
| තානාපති කාර්යාලය - ජෙඩාර් | 00966126065414 |
| තානාපති කාර්යාලය - රියාද් | 0096614608232/5 |
| තානාපති කාර්යාලය - කුවේට් | 009652533914 0/42 |
| තානාපති කාර්යාලය - ඕමාන් | 0096824697841/2 |
| තානාපති කාර්යාලය - කටාර් | 0097444998660 |
| තානාපති කාර්යාලය - සිංගප්පූරුව | 006562544595/96/97 |
| තානාපති කාර්යාලය - අබුඩාබි | 0097126325335 |
| තානාපති කාර්යාලය - බහරේන් | 0097317008410 |
| තානාපති කාර්යාලය - ඊශ්‍රායල් | 0097235277635 |
| තානාපති කාර්යාලය - ජෝර්දාන් | 0096265820611/2 |
| තානාපති කාර්යාලය - ලෙබනන් | 009615769585 |
| තානාපති කාර්යාලය - මැලේසියාව | 0060342568987 |
| තානාපති කාර්යාලය - මාලදිවයින | 009603322845 |
| තානාපති කාර්යාලය - දකුණු කොරියාව | 008227352966/7 |
| තානාපති කාර්යාලය - තායිලන්තය | 6621054851 |
| තානාපති කාර්යාලය - මියන්මාරය | 9518222812 |
| තානාපති කාර්යාලය - නේපාලය | 97714720623 |
| තානාපති කාර්යාලය - වියට්නාමය | 84-2437341894 |
| තානාපති කාර්යාලය - තුර්කිය | 903124271020-25 |
| තානාපති කාර්යාලය - නවදිල්ලිය | 911123010201 |
| තානාපති කාර්යාලය - ඉන්දුනීසියාව | 62213141016 |

**පැය 24 සේවය - 1989**

## මිනිස් වෙළඳාම හා ජාවාරම් සිද්ධි පිළිබඳ පැමිණිල්ලක් කිරීමට, තොරතුරක් ලබා දීමට හෝ විමසීමට අවශ්‍යනම් පහත දුරකථන අංකවලට දැනුම් දෙන්න.

| | |
|---|---|
| 0112 101 500<br>0112 101 600<br>දිගු අංකය: 634 | **ආගමන විගමන දෙපාර්තමේන්තුව**<br>(තැනැත්තන් වෙළඳාම තුරන් කිරීමේ ජාතික සම්පත් මධ්‍යස්ථානය) |
| 0112 864 241 | **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය** (විශේෂ විමර්ශන අංශය) |
| 0112 884 707 | **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය** (මිනිස් වෙළඳාමට එරෙහි ඒකකය) |
| 0112 514 375 | **අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව**<br>(තැනැත්තන් වෙළඳාම් කිරීම/ ජාවාරම් විමර්ශණය හා සමුද්‍රිය අපරාධ විමර්ශණ කොට්ඨාශය) |
| 0112 325 372<br>0112 325 373<br>0112 323 015 | **විදේශ කටයුතු අමාත්‍යාංශය**<br>(කොන්සියුලර් අංශය) |
| 0112 445 368 | **ශ්‍රී ලංකා නාවික හමුදාව** |
| 0112 444 444 | **ශ්‍රී ලංකා පොලීසිය**<br>(කාන්තා හා ළමා කාර්යංශය) |
| 1929 | **ජාතික ළමාරක්ෂණ අධිකාරිය** |

RESILIENCE FUND
Supporting community responses to Organized crime

GLOBAL INITIATIVE
AGAINST TRANSNATIONAL ORGANIZED CRIME

SAFE Foundation
SRI LANKA